


වෙන මුද්‍රණාලයක් හොයමින් ඉන්නකොට බොරැල්ලෙ දිවයින මුද්‍රණාලය හමුවුණා. එහි තමයි ඩී බී ධනපාල මහත්තය පටන් ගත්ත දිවයින පත්තරේ මුද්‍රණය කළේ. ඒ වන විට ධනපාල මහත්තය දවස පත්තරේට ගිහිල්ල හිටියෙ. එතන වැඩ කළා ම ආ විමල්. විපුල ධර්මවර්ධන වගේ අය.. ජස්ටින් සිරිවර්ධන මහත්තයට තමයි අයිතිව තිබුණෙ.. ඉතින් මගේ පත්තරය මේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන්න පටන් ගත්තා.. මාසෙකට එකයි ගැහුවෙ. පත්තරේ ජනප්‍රිය වුණා.. පත්තර 20000 ක් මුද්‍රණය කළා.. ගාල්ලෙ හිටිය ගුරුගේ කියල මහත්තයෙක්.. එයා පත්තර දාහක් වික්කා.. නිමල් සිරිපාල ඇමතිතුමා ඒ කාලෙ නාලන්දෙ ශිෂ්‍යයෙක්... එතුමා පත්තර 250 ක් වික්කා..

ලැබෙන්නෙ.. ඉතින් මගෙන් ඇහුවා ප්‍රෙස් එක ගන්න කැමතිද කියලා.. මම ඇහුවා කීයද කියලා.. ප්‍රෙස් එක තිස්දාහකට ගන්න මම කැමති වුණා. මේ 1962 දී. මට අවුරුදු 19 යි. අතේ සල්ලි තිබ්බෙත් නැහැ. රුපියල් 5000 ක් ඇඩ්වාන්ස් දුන්නා. ඉතුරු මුදලත් 5000 ගානෙ ගෙවන්න අවසර දුන්නා.

ඔය අතරේ තේජා ගුණවර්ධන නෝනත් ප්‍රෙස් එක බලන්න ආවා. ඒගොල්ලො 48000 කට ඒක ගත්තා. අනිත් එක ප්‍රෙස් එක විකුණුව අයට ඕනෙ වුණේ ඒක එතනින් අයින් කරන්න.. මට ප්‍රෙස් එක ගෙනියන්න තැනකුත් තිබුණෙ නැහැ. අනික් අතින් මේ ඉස්කෝලෙ




*"හෙළබිම" - ශ්‍රී ලංකාවේ ප්‍රථම ළමා පුවත්පත - ගැන කතාබහක්*

සිංහල පොත පත ගැන කතාකරන විට ඔහුගේ නම මුලමට එයි. 1962 දී පොත් ප්‍රකාශණයට අත තැබූ ඔහු අද වන විට දහස් ගණනක් පොත් සිංහල පොත් නාමාවලියට එක් කර ඇත. පොත් ප්‍රකාශණයේ ඉහළ ප්‍රමිතියක් හඳුන්වාදුන් ඔහු තවමත් ඒ ප්‍රමිතිය රැක ගනිමින් ඉදිරියටම යමින් සිටියි. සමහැ ප්‍රකාශකයන් අතින් නිකුත් වන බාල ප්‍රමිතියෙන් යුත් පොත් අතර ඔහුගේ පොත් තවමත් කැපී පෙනෙයි. ඔහු පොත් ප්‍රකාශණයේ නව නැම්මක් ඇති කළ දයාවංශ ජයකොඩි මහතා යි.

ශ්‍රී ලංකාවේ පළමු ළමා පුවත්පත ලෙස සැළකිය හැකි "හෙළබිම" පුවත් පත 1961 දී බිහි කරන විට ඔහු පාසල් සිසුවෙකි. පොත පත කෙරෙහි තිබූ දැඩි බැඳීම නිසාම සිය උසස් අධ්‍යාපනය පවා කඩාකප්පල් කරගත් ඔහු සුවහසක් පාඨකයනට ආනන්දයත් ප්‍රඥාවත් බෙදා දෙමින් කරන සේවය මිල කළ නොහැකි ය.

ඔහු හා අප ගත කළ සොඳුරු නිමේෂයක් මෙසේ සටහන් කර තබමු.

**අපි මුලින්ම හෙළබිම පුවත්පත බිහිවුණ ආකාරය ගැන කතා කරමුද?**

මුලින්ම මම හයවෙනි පන්තියෙ ඉගෙන ගන්නකොට අතින් ලිව්ව පත්තරයක් සිසුමිණ කියලා මගේ ළඟ වාඩි වෙලා හිටියා තේජා ගුණවර්ධන නෝනා මහත්මියගෙ පුතා. ඒගෙ

**ඒ කාලෙ අපි සිරිධම්ම මාවතේ හිටියෙ. තාත්ත සාප්පුවට ආවට පස්සෙ තමයි මම ඉස්කෝලෙ යන්නෙ.. ඒත් එකදවසක් මම කාර් එකේ ඉස්කෝලෙ යනවා තාත්තට අහු වුණා.. කම්මුලටම ගැහුවා.. අවවාද කලා පුතේ කවදාවත්ම එහෙම කරන්න එපා කියලා. අපි ඉස්කෝලෙට අඩි දහයක් ළඟින් හිටියෙ.. ළමයි පයින් ඉස්කෝලෙ එනවා. ගුරුවරු පයින් එනවා.. ඒහෙම තියෙද්දි කාර් එකක් එළවගෙ න ඉස්කෝලෙ යන්න එපා කිව්ව..**

# පොත් ප්‍රකාශණයේ ජය කෙහෙළි නැංවූ දයාවංශ ජයකොඩි

*සංවාද සටහන*
ජගත් ජේ එදිරිසිංහ

ාල්ලන්ට තිබුණා මුද්‍රණාලයක් ආර්ට් ප්‍රින්ටර්ස් කියලා. ඉතින් එයා කිව්ව අම්මට කියලා පත්තරේ අච්චු ගස්සලා දෙන්නම් කියලා. ඉතින් සිසුමිණ එතන මුද්‍රණය කළා.. ඒත් එක පත්තරයයි ගැහුවෙ.

**ඒ කාලෙ කොපමණ මුදලක් ගියාද මේ වැඩේට**

රුපියල් අනූවයි.. ඒකෙන් 45 ක් ගෙව්වා.. ඉතුරු මුදල ගෙවන්න බැරි වුණා. පොඩි එකෙක්ගෙ වැඩේ නිසා ඉල්ලුවෙත් නැහැ. තාමත් හතළිස් පහක් ණයයි.. පත්තරේ වික්කෙ සත දහයට

මේ වැඩ වලට කොයිතරම් ආසාවක් තිබුණත් අධ්‍යාපන වැඩ නිසා දිගටම කරගෙන යන්න බැරි වුණා. ඒ නිසා අපොස සාමාන්‍ය පෙළ අවසන් වෙනකන් ඉඳලා හෙළබිම පටන් ගත්තා. මහාබෝධි මුද්‍රණාලයෙ තමයි මුද්‍රණය කළේ. කළාප තුනක් එහි මුද්‍රණය කළා.. 1961 දි..
නමුත් මේ මුද්‍රණාලයේ මුද්‍රණ තත්වය පිළිබඳව මට සතුටක් තිබුණෙ නැහැ.. ඒ නිසා මම

මේ කාලෙ මම සිංහල සාහිත්‍ය සංගමයේ සභාපති වෙලා හිටියා.. විවාද කන්ඩායමෙත් නායකයා.. අපි යනවා විවාද වලට විවිධ ඉස්කෝල වලට.. එහෙම ගියාම ඒ ඒ ඉස්කෝල වල අය එක්ක පත්තරේ ගැන කතා කරලා ඒ අයගේ සහයෝගයත් ගත්තා..

**පත්තරේ ගෙනියන්න ගෙදරින් මුදල් ලැබුණද?**

මුලින්ම අම්මා පොඩි මුදලක් දුන්නා.. පස්සෙ පත්තරෙන් ආදායමක් ආවා.. ඇයි මේක ගොඩක් ජනප්‍රිය වුණානෙ.. කොච්චර ජනප්‍රිය වුණාද කිව්වොත් එච්එස්සී පන්තියට යනකොට මම රුපියල් 9250 ක් දීලා කාර් එකකුත් ගත්තා.. EY 9524.. කාර් එනෙක් තමයි ඉස්කෝලෙ යන්නෙ.

ඒ කාලෙ අපි සිරිධම්ම මාවතේ හිටියෙ. තාත්ත සාප්පුවට ආවට පස්සෙ තමයි මම ඉස්කෝලෙ යන්නෙ.. ඒත් එකදවසක් මම කාර් එකේ ඉස්කෝලෙ යනවා තාත්තට අහු වුණා.. කම්මුලටම ගැහුවා.. අවවාද කලා පුතේ කවදාවත්ම එහෙම කරන්න එපා කියලා. අපි ඉස්කෝලෙට අඩි දහයක් ළඟින් හිටියෙ.. ළමයි පයින් ඉස්කෝලෙ එනවා. ගුරුවරු පයින් එනවා.. ඒහෙම තියෙද්දි කාර් එකක් එළවගෙන ඉස්කෝලෙ යන්න එපා කිව්ව..

ඔහොම යනකොට පත්තරේ අච්චු ගහපු ප්‍රෙස් එක විකුණන්න දැම්මා.. පාඩුයි කියලා.. මගේ පත්තරේ සල්ලි වලින් තමයි වැඩ කළ අයට පඩි ගෙව්වෙ.. මම එතනට යනකොට මට කියනවා ඔන්න ඔන්න අපේ බැංකුව එනවා කියලා.. මොකද මම බිල ගෙව්වමනෙ පත්තරේ අයට පඩි

යන කොල්ලා ප්‍රෙස් එක අරගෙ අධ්‍යාපනය කඩා කප්පල් කර ගනියි කියලා ඒ අය හිතන්නත් ඇති. ඉතින් මට ප්‍රෙස් එක ගන්න බැරි වුණා. පත්තරෙත් එතනින්ම නැවතුණා.

**මේ වෙනකොට කොයි තරම් කාලයක් පත්තරය කරගෙන ගිහින් තිබුණ ද?**

අවුරුදු 4ක් විතර.. සම්මාන මදිවෙලා මම එච්එස්සී පන්තියෙ දෙපාරක් හිටියා. පත්තරේ නිසා තමයි අධ්‍යාපනය කඩාකප්පල් වුණේ. එස්එස්සී පන්තියෙ මට සම්මාන 5 ක් තිබුණා. එච්එස්සී කළේ මෙඩිසින්. ඉංග්‍රීසි මාධ්‍යයෙන්. ඒත් මගේ උනන්දුව තිබුණෙ පත්තරේට. ඇයි ඉතින් දැන්වීම් හොයන්න ඕනෙ ලිපි හොයන්න ඕනෙ මුද්‍රණය කරන්න ඕනෙ.. ඉතින් අධයාපනය කඩාකප්පල් වුණා. පස්සෙ තාත්ත කිව්ව ඇවිත් තාත්තගෙ ලී බඩු සාප්පුවෙ වැඩ කරන්න කියලා. ඒත් ඉතින් හිත තිබුණෙම පොත් පත්තර එක්ක.

පත්තරේ ගහන කාලෙම මම හෙළබිම

11 වන පිටුවට